# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2056/35 – 2018 පෙබරවාරි 01 වැනි බ්‍රහස්පතින්දා – 2018.02.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 31 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/යුඩී/77.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ඩීඑස්/ජීඑෆ්ජී/එල්ඇන්ඩ්එල්/05/90.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි තීරයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, කඩවත් සතර, ගාල්ල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙද්දුගොඩ දකුණ මාඉටිපේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/ජීඑෆ්ජී/2017/645 හා 2017.11.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලි වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට: ඒ. මනම්පේරි හිමිකම් කියන ඉඩම සහ ඇළ; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය, බොම්බෙකාසල් ඇළ, කැබලි අක්ෂර බී සහ බස් නැවතුම්පල; බටහිරට: බස් නැවතුම්පල.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0065**

උතුරට: මාර්ගය සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: බොම්බෙකාසල් ඇළ; දකුණට: බස් නැවතුම්පල; බටහිරට: බස් නැවතුම්පල.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0003**

උතුරට: කැබලි අක්ෂර බී සහ බොම්බෙකාසල් ඇළ; නැගෙනහිරට: මාර්ගය; දකුණට: බොම්බෙකාසල් ඇළ සහ යූ. කේ. ප්‍රියන්ත පෙරේරා හිමිකම් කියන පුවක්වත්ත;බටහිරට: මාර්ගය.

04. **කැබලි අක්ෂර 'ඩී' – බොම්බෙකාසල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0002**

උතුරට: ඒ. ජී. සෝමලතා හිමිකම් කියන ඉඩම සහ බොම්බෙකාසල් ඇළ; නැගෙනහිරට: බොම්බෙකාසල් ඇළ; දකුණට: බොම්බෙකාසල් ඇළ, කැබලි අක්ෂර ඊ සහ එම්. ජී. එම්. මිශ්රාෆ් හිමිකම් කියන බොම්බෙකාසල් වත්ත; බටහිරට: පී. ජී. සිසිර කුමාර හිමිකම් කියන බොම්බෙකාසල් වත්ත.

05. **කැබලි අක්ෂර 'ඊ' – බොම්බෙකාසල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0001**

උතුරට: පී. ජී. සිසිර කුමාර හිමිකම් කියන බොම්බෙකාසල් වත්ත සහ කැබලි අක්ෂර ඩී; නැගෙනහිරට: බොම්බෙකාසල් ඇළ; දකුණට:බොම්බෙකාසල් ඇළ සහ සිත්ති අසික් හිමිකම් කියන බොම්බෙකාසල් වත්ත;බටහිරට: එම්. ජී. එම්. මිශ්රාෆ් හිමිකම් කියන බොම්බෙකාසල් වත්ත.

06. **කැබලි අක්ෂර 'එෆ්' – බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0004**

උතුරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත; නැගෙනහිරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත සහ බොම්බෙකාසල් ඇළ; දකුණට: බොම්බෙකාසල් ඇළ;බටහිරට: බොම්බෙකාසල් ඇළ.

07. **කැබලි අක්ෂර 'ජී' – බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0005**

උතුරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත; නැගෙනහිරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත; දකුණට: කැබලි අක්ෂර එච් සහ බොම්බෙකාසල් ඇළ; බටහිරට: බොම්බෙකාසල් ඇළ.

08. **කැබලි අක්ෂර 'එච්' – බෙලෙක්මන්කනත්තේ අද්දරවත්ත– ප්‍රමාණය: හෙක්. 0.0033**

උතුරට: බොම්බෙකාසල් ඇළ, කැබලි අක්ෂර ජී සහ හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන් කනත්තේ අද්දරවත්ත; නැගෙනහිරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන් කනත්තේ අද්දරවත්ත; දකුණට: බොම්බෙකාසල් ඇළ;බටහිරට: බොම්බෙකාසල් ඇළ.

09. **කැබලි අක්ෂර 'ජේ' – ප්‍රමාණය: හෙක්. 0.0001**

උතුරට: බොම්බෙකාසල් ඇළ; නැගෙනහිරට: හිමිකරු සොයාගත නොහැකි බෙලෙක්මන් කනත්තේ අද්දරවත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අක්ෂර කේ;බටහිරට: බොම්බෙකාසල් ඇළ සහ මාර්ගය.

10. **කැබලි අක්ෂර 'කේ' – ප්‍රමාණය: හෙක්. 0.0035**

උතුරට: කැබලි අක්ෂර ජේ සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: බොම්බෙකාසල් ඇළ; බටහිරට:බොම්බෙකාසල් ඇළ.

02 - 530

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 32 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2017/යුඩී/172.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
කේඩීඑස්/පීඩීබී/4/3/10(III).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, පාතදුම්බර.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, වළල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/පීටීඩී/2017/596 හා 2017.11.29 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කැබලි වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කන්කානියාගේ කුඹුර වනාත – ප්‍රමාණය: හෙක්. 0.0008**

උතුරට: මාර්ගය(මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය(මා.සං.අ.) සහ ඩබ්. එම්. පී. එන්. වහින්දර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර; දකුණට: ඩබ්. එම්. පී. එන්. වහින්දර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර සහ කේ. ඒ. එන්. ඩබ්. නානායක්කාර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර වනාත; බටහිරට: කේ. ඒ. එන්. ඩබ්. නානායක්කාර හිමිකම් කියන කන්කානියාගේ කුඹුර වනාත සහ ඇළ.

02-531

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2017 අංක 325 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/ඉසෙඩ්/79.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) යටතේ අංක 2049/7 හා 2017.12.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 2017 අංක 325 දරන ආඥාවෙහි උපලේඛනයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි "ප්‍රාදේශීය ලේකම්, බුලත්සිංහල" යන්න වෙනුවට එය "ප්‍රාදේශීය ලේකම්, රඹුක්කන" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02-532